# ජීවිත රක්ෂණය පිළිබඳ පුද්ගලාකල්පඃ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්

නිරෝමි ගුණරත්න
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
niromisa55@gmail.com

ජීවිතාශය පොදු පුද්ගල මනෝභාවකි. එහෙත් ජීවිතය පිළිබඳ අවිනිශ්චිතතාව නිසාම මිනිසුන් කිසියම් කාන්සාමය තත්ත්වයකින් ජීවත් වන බව මනෝවිඥයින්ගේ මතයයි. මිනිසා ජීවිත සුරක්ෂාව විෂයෙහි විවිධ ක්‍රමෝපායන් යොදාගනී. අනපේක්ෂිතව සිදුවන ජීවිත හා දේපල හානිවලින් ආරක්ෂාවීමට මිනිසා විසින් සකස් කරගත් ක්‍රමෝපායක් ලෙස රක්ෂණය හැඳින්විය හැකිය. එය වර්තමානය වනවිට මිනිසාගේ මූලික අවශ්‍යතා අතරට ද එක්වේ. මෙහිදී ජීවිත රක්‍ෂණය පිළිබඳ පුද්ගලාකල්පය පිළිබඳව මනෝවිද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම මූලික අරමුණ විය. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස හෝමාගම සහ ගොඩගම යන ප්‍රදේශ තෝරාගනිමින් 21 - 40 සහ 41 - 60 යන මූලික වයස් කාණ්ඩ දෙකක් යටතේ පිළිගත් රක්ෂණ ආයතනවල ජීවිත රක්ෂණාවරණ සහිත සහ රහිත පුද්ගලයින් 20 දෙනෙකු බැගින් 40 දෙනෙකුගෙන් යුතු නියැදියක් තෝරාගැණිනි. තෝරාගත් නියැදිය අනුව සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ක්‍රම යොදාගනිමින් ලබාගත් දත්ත විශ්ලේෂණය කෙරිණ.
රක්ෂණාවරණ සහිත පුද්ගලයින්ගේ නියැදිය තුළ සිටි පුද්ගල කාණ්ඩ තුන අතරින් දැනුවත්ව සහ සේවාප්‍රවර්ධන මත රක්ෂණාවරණ ලබාගත් දෙපිරිස තුළ නොදැනුවත්ව එම සේවාවන් ලබාගත් පිරිසට වඩා ජීවිතය පිළිබඳ අවදානම් මානසිකත්වය ඉවත්වීම, සමාජමය වශයෙන් සුබවාදී සිතුවිලි ඇතිවීම, පවුලේ සෙසු සාමාජිකයින් කෙරේ පෙරට වඩා ධනාත්මක සිතුවිලි ඇති වීම, ආයෝජන අවස්ථාව සහ ප්‍රතිලාභී මානසිකත්වය වැනි සුරක්ෂිත මනෝභාවයන් සහිත බව පෙන්නුම් කෙරිණි. එහෙත් වාරික ගෙවීම මත වගකීම් මානසිකත්වය තුළින් ඔවුන් තුළ කාංසා ලක්ෂණ පැවතින බව ද හඳුනා ගැණිනි. රක්ෂණාවරණ නොමැති නියැදිය තුළ සිටින පුද්ගල කාණ්ඩ දෙක අතර කලක් රක්‍ෂණාවරණ පැවති නමුත් වාරික ගෙවීමේ අපහසුතාව සහ හානිපූරණය කරගැනීමේදී විශ්වාසය පළුදුවීම තුළින් අතහැර දැමූ පිරිස් තුළ ඉච්ඡාභංගත්වය හා කළකිරීම් සහිත මානසිකත්වයන් පවතින බව හඳුනාගැණිනි. ජීවිත රක්‍ෂණයණයක අවශ්‍යතාව ඇතත් එවැන්නක් පවත්වාගෙන යෑමට තරම් ආර්ථික ශක්තියක් නොමැති පිරිස් අතර එක් පිරිසක් තුළ ජීවිත රක්‍ෂණයණ පිළිබඳ අධිතක්සේරුවක් මෙන්ම තවත් පිරිසක් තුළ ජීවිතය හෝ එහි අවධානම් පිළිබඳව සුවිශේෂී මනෝභාවයන් නොපෙන්වීය.
සමස්තයක් ලෙස බොහෝ පුද්ගලයින් ජීවිත රක්‍ෂණාවරණයක් අපේක්‍ෂා කළත් හානිපූරණය සඳහා වන කොන්දේසි සේවාදායකයාට වඩාත් ඵලදායි නොවීම, ප්‍රතිලාභ හිමිවීම පිළිබඳව පවතින අවිනිශ්චිතතාව රක්ෂණාවරණ පිළිබඳ ව මිනිසුන් තුළ ඍණාත්මක ආකල්ප ඇතිකිරීමට හේතු වී තිබිණි. එබැවින් උචිත ප්‍රතිපත්ති සකස් කිරීම. රක්‍ෂණයක අගය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම හා සම්පූර්ණයෙන්ම රජය විසින් රක්ෂණ ආයතන සකස් කිරීම තුළින් ජීවිත රක්‍ෂණ පිළිබඳ මෙන්ම ජීවිතය පිළිබඳ පුද්ගලාකල්ප ධනාත්මක කිරීමේ හැකියාව පවතී.

**ප්‍රමුඛ පදඃ** රක්ෂණය; මානසිකත්වය; අවිනිශ්චිත ; ජීවිතය